# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,557 - 2008 ජූලි මස 04 වැනි සිකුරාදා - 2008.07.04**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 662 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 663 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 664 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 ජූලි මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 ජූනි මස 27 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2008 අංක 351

D/RF/824/NY/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීමක්

*2004 අප්‍රේල් මස 06 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් (තවකාලික ලුතිනන් කොමාණ්ඩර්) මානික්කුවාදුර අසංක කෞශාල් මෙන්ඩිස්, එන්ආර්එක්ස් 0797, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ.

07- 99

---

2008 අංක 352

D/RF/824/NY/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2007 මාර්තු මස 20 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) මදවන් ආරච්චිගේ ගජිත් ප්‍රියන්ත, එන්ආර්එක්ස් 0897, ශ්‍රීලංනාහ

*2008 ජනවාරි මස 23 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) වාසල්තිලකගේ කපිල නේරංජන නලින් කුමාර ආරියරත්න, එන්ආර්එක්ස් 1020, ශ්‍රීලංනාහ

*2008 ජනවාරි මස 27 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) දිසානායක මුදියන්සේලාගේ නලින්ද ප්‍රසාද් දිසානායක, එන්ආර්එක්ස් 0879, ශ්‍රීලංනාහ

ගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹ.

07- 96

---

2008 අංක 353

D/RF/824/NY/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2007 සැප්තැම්බර් මස 17 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නීති ) වශයෙන් :*

ලුතිනන් (නීති) විජේතුංග ලියන පටබැඳිගේ සුසන්ත උපේන්ද්‍ර, එන්ආර්ජ් 1605, ශ්‍රීලංනාහ

ගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 මාර්තු මස 04 වැනි දින,
කොළඹ.

07- 97

---

2008 අංක 354

D/RF/824/NY/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2007 ඔක්තෝබර් මස 22 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ) ලියනගේ දොන් දිමුතු නිරංජන් , එන්ආර්එස් 1085, ශ්‍රීලංනාහ

*2007 ඔක්තෝබර් මස 31 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ) ජයමාන්න මොහොට්ටිගේ දොන් ජනක නිශාන්ත ජයමාන්න, එන්ආර්එස් 1121, ශ්‍රීලංනාහ

ලුතිනන් (සැ) මහමන්ඩඩිගේ ප්‍රදීප් ප්‍රනාන්දු, එන්ආර්එස් 1122, ශ්‍රීලංනාහ

ගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ.

07- 98

ඩී/ඒඑෆ්/478.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව - ස්ථිර බලසේනාව**

**අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයක් අවලංගු කිරීම**

පහත නම සඳහන් නිලධාරියා 2005 මැයි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිකාරිය ඉවත් කරනු ලැබූ, 2005 අගෝස්තු 12 වන දිනැති අංක 1,406 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ අංක ඩී/ඒඑෆ්/478 දරන 2005 ජුනි මස 16 දිනැති නිවේදනය අවලංගු කෙරේ.

ස්කොඩ්රන් ලීඩර් කැලුම් වීරවර්ධන (01754) - ගු.තො.නි.

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

07- 100

2008 අංක 355

ඩී/ඒඑෆ්/478.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

**අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්**

2005 ජුනි මස 24 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කර ඇත.

ස්කොඩ්රන් ලීඩර් කැලුම් වීරවර්ධන (01754) ගු.තො.නි.

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

07- 95

# ආණ්ඩුවේ නිවේදන

**පෙරියකට්ටු ශාන්ත අන්තෝනි දෙව්මැදුරේ උත්සවය - 2008**

ඉහත සඳහන් උත්සවය 2008 ජූලි මස 31 වැනි දින ආරම්භ කර 2008 අගෝස්තු මස 03 වැනි දින අවසන් කරන බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

02. මේ පිළිබඳව 1949.05.27 වැනි දින අංක 9978 හා 1950.05.26 දින අංක 10105 දරන ගැසට් පත්‍රවල පළමු නිවේදනවලට පොදු මහජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාලසීමාව තුළ වලංගු වනවා ඇත.

එස්. ෂන්මුගම්,
වවුනියාව දිසාපති/දිස්ත්‍රික් ලේකම්.

2008 ජුනි මස 12 වැනි දින,
වවුනියාව දිසාපති කාර්යාලයේ දී ය.

07-57

---

**ඔඩ්ඩුසුඩ්ඩාන් තාන්දෝන්රි ඊස්වරර් කෝවිල් උත්සවය - 2008**

ඉහත සඳහන් උත්සවය 2008 ජූලි මස 02 වැනි දින පෙරවරු 6.00ට ආරම්භ කර 2008 ජූලි මස 17 වැනි දින පස්වරු 6.00 ට අවසන් කරන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මේ පිළිබඳව 1949 මැයි 27 වැනි දින අංක 9978 හා 1950 මැයි මස 26 වැනි දිනැති අංක 10105 දරන රෙගුලාසිවලට පොදු ජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත්කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ වලංගු වනවා ඇත.

ඉමෙල්ඩා සුකුමාර්,
දිසාපති,
මුලතිව් දිස්ත්‍රික්කය.

2008 ජුනි මස 10 වැනි දින.

07 - 45

---

**වන්දනා ගමන් ආඥාපනත**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ශ්‍රී විශ්ණු මහා දේවාලයේ 2008 වර්ෂික ආගමික උත්සවය 2008 අගෝස්තු මස 10 වැනි ඉරිදා සිට 2008 අගෝස්තු මස 24 වැනි ඉරිදා දින දක්වා පවත්වනු ලබන බව, වන්දනා ගමන් ආඥාපනතේ (175 වැනි පරිච්ඡේදය) රෙගුලාසිවල 10 වැනි වගන්තිය අනුව 1959 නොවැම්බර් මස 20 වැනි දින නිකුත් කරන ලද අංක 11959 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය යටතේ මෙයින් දන්වමි.

එච්. ජී. එස්. ජයසේකර,
දිස්ත්‍රික් ලේකම්,
මාතර.

2008 ජුනි මස 09 වැනි දින,
මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

07-04

අංකය : ප්‍ර. නො. 11/2/35/14/2007/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/ පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2008.07.07 වැනි දින සිට 2008.07.21 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2008.07.28 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
අංක 243/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

*උපලේඛනය*

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "බී" දරන කොට්ඨාසයේ 317 වෙළුමේ 229 දරන පත් ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, හැඳල තිඹිරිගස්යාය යන ගම පිහිටි වී බුසල් දහයක වපසරියෙන් යුත් පරගහ කුඹුර නමැති ඉඩමට මායිම් :<br>*උතුරට* : මාවලගේ දොන් කාර්ලු අප්පුහාමිට අයිති වැලි අමුණ කුඹුර,<br>*නැගෙනහිරට* : වරාගොඩ කංකානමලාගේ දොන් ජුවානිස් අප්පුහාමිට සහ තවත් අයට අයිති ඉඩම,<br>*දකුණට* : දැනට කුරුම්බල පිටියගේ දොන් කොර්නේලිස්ට අයිති කුඹුරෙහි කොටසක සීමාව,<br>*බස්නාහිරට* : මාවලගේ දොන් කාර්ලු අප්පුහාමිට සහ තවත් අයට අයිති ඉඩම්වල සීමාවන් | ඩබ්. එච්. ඩබ්. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1937 ජනවාරි මස 08 වැනි දින අංක 1118 දරන විකුණුම්කර ඔප්පුව<br>02. වයි. ඒ. ඩී. එන්. ඒ. විජේරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1986 ජනවාරි මස 14 වන දින අංක 860 දරන තෑගි ඔප්පුව. |

07-08

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 23441 හා 2006.01.04 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම වේයන්ගොඩ මැණික් අච්චිගේ සීතා නන්දනී යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 පෙබරවාරි මස 29 වැනි දිනට ඉහත කී

අංක 23441 දරන උකස් බැඳුම්කරය මත ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් අටලක්ෂ දහතුන් දහස් දෙසිය පනස් දෙකකුත් ශත තිස් එකක (රු. 8,13,252.31) මුදලක් සහ 2008 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හයලක්ෂ හැට නව දහස් හාරසිය පනස් හතරකුත් ශත පනස් හතරක් (රු. 6,69,454.54) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට අටක (8%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් අටලක්ෂ දහතුන් දහස් දෙසිය පනස් දෙකකුත් ශත තිස් එකක (රු. 8,13,252.31) මුදල සහ 2008 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හය ලක්ෂ හැටනම දහස් හාරසිය පනස් හතරකුත් ශත පනස් හතරක් (රු. 6,69,454.54) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි ඒ සඳහා මාර්ග අයිතිය ද සමග විකිණීම පිළිබඳව ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තුද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 23441 දරන උකස් බැඳුම්කරය මගින් ද ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි ඒ සඳහා මාර්ග අයිතිය ද සමග කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

*අංක 23441 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දේසිය පත්තුවේ, මාරපොල ග්‍රාමයේ පිහිටි "මාරපොළ එස්ටේට් ඒ කොටස " නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. පී. ආර්. පතිරාජ විසින් මැන සාදන ලද අංක 1883 හා 1996.04.27 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 190 ලෙස ලකුණුකළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ලොට් අංක 180 ද, නැගෙනහිරට : ලොට් අංක 191 ද, දකුණට : ලොට් අංක 195 ද, බස්නාහිරට : ලොට් අංක 189 ද යන මායිම් ඇතුළත පර්චස් පහළොවක් (අ. 0. රූ. 0 පර්. 15) නොහොත් වර්ග මීටර් 379.5ක් විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

මෙයට ඉහත කී අංක 1883 දරන පිඹුරේ පාරක් සඳහා වෙන්කර ඇති බිම මතින් මාර්ග අයිතියද ඇතුළත් වේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

07-85/1

---

එන්(පීවීඑස්) 27141.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ලියනගේ ඔටෝ ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් " හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2000.10.05 දින සංස්ථාපිත සමාගමක් වන ලියනගේ ඔටෝ ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, ලියනගේ ඔටෝ ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූනි මස 12 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-06

---

එන්(පීවීඑස්) 11567.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ජේ. එච්. වයි. ටෙක්ස්ටයිල් ඉන්ඩස්ට්‍රි (ප්‍රයිවට්) ලිමිටඩ් " හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1993.08.23 දින සංස්ථාපිත සමාගමක් වන ජේ. එච්. වයි. ටෙක්ස්ටයිල් ඉන්ඩස්ට්‍රි(ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, ජේ. එච්. වයි. ටෙක්ස්ටයිල් ඉන්ඩස්ට්‍රි (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූනි මස 12 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-26

එන්(පීවීඑස්) 3777

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " සුනේත්‍රා ප්‍රොපර්ටි ට්‍රේඩිස් (ප්‍රයිවට්) ලිමිටඩ් " හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1987.08.27 දින සංස්ථාපිත සමාගමක් වන " සුනේත්‍රා ප්‍රොපර්ටි ට්‍රේඩිස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, " සුනේත්‍රා ප්‍රොපර්ටි ට්‍රේඩිස් (ප්‍රයිවට්) ලිමිටඩ් " නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූනි මස 12 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-25

---

එන්(පීවීඑස්) 9621.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " සෙරන්ඩිබ් ෆැබ්රික්ස් කන්සෝටියම්(ප්‍රයිවට්) ලිමිටඩ් " හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1992.08.14 දින සංස්ථාපිත සමාගමක් වන " සෙරන්ඩිබ් ෆැබ්රික්ස් කන්සෝටියම්(ප්‍රයිවට්) ලිමිටඩ් " ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "සෙරන්ඩිබ් ෆැබ්රික්ස් කන්සෝටියම් (ප්‍රයිවට්) ලිමිටඩ් " නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,

2008 ජූනි මස 12 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-24

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 24557 හා 2006.12.22 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "ලක්දීපනී කුමාරි ෆැෂන්ස්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ අයිතිකරු ලෙස නෙලුන්දෙනියේ ව්‍යාපාරය කරගෙන යන නෙලුන්දෙනියේ ලේකම්ලාගේ දීපා රාණි වරුසප්පෙරුම යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 පෙබරවාරි මස 29 වැනි දිනට ඉහත කී අංක 24557 දරන උකස් බැඳුම්කරය මත එකී ලේකම්ලාගේ දීපා රාණි වරුසප්පෙරුමගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් තිස්හතර ලක්ෂ අනූතුන්දහස් හයසිය හතළිස් නවයකුත් ශත තිස් දෙකක (රු. 34,93,649.32) මුදලක් සහ 2008 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස් ලක්ෂයක් (රු. 30,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තිස්හතර ලක්ෂ අනූතුන් දහස් හයසිය හතළිස් නවයකුත් ශත තිස් දෙකක (රු. 34,93,649.32) මුදල සහ 2008 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස් ලක්ෂයක් (රු. 30,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි විකිණීම පිළිබඳව ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 24557 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 24557 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිනිගොඩ කෝරළේ, දෙයලදහමුණ පත්තුවේ, පල්ලේ කරඬුපොන පිහිටි දන්ගහපෑල නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. බී. බැද්දෙවෙල විසින් මැන සාදන ලද අංක 1533 හා 1962.10.01 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් සී ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : කොළඹ මහනුවර පාර ද, නැගෙනහිරට : ලොට් එෆ් දරන බිම් කට්ටිය ද, දකුණට : රැලගලේහේන සහ ඇල ද, බස්නාහිරට : අංක 1533 දරන පිඹුරේ ලොට් ඩී දරන බිම් කට්ටිය ද, යන මායිම් ඇතුළත රූඩ් එකයි, පර්චස් එකකුත් දශම දෙකක් විශාලත්වය (අ. 0, රූ. 1, පර්. 1.2) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

මැතකදී කරන ලද මැනුමකට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිනිගොඩ කෝරළේ, දෙයල දහමුණ පත්තුවේ, පල්ලේ කරඬුපොන ග්‍රාමයේ පිහිටි දන්ගහපෑල නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. සී. එල්. ජී. අතුකෝරළ විසින් මැන සාදන ලද අංක 2822 හා 2006.09.10 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් සී1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : නුවර පාර ද, නැගෙනහිරට : ලොට් එෆ් දරන බිම් කට්ටිය ද, දකුණට : ඇල ද, බස්නාහිරට : ලොට් ඩී දරන බිම් කට්ටිය ද යන මායිම් ඇතුළත පර්චස් තිස් අටකුත් දශම පහක් (අ. 0, රූ. 0, පර්. 38.5) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

07-85/3

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. එස්. කන්නන්ගර විසින් ලියා සහතික කරන ලද අංක 440 හා 2005 නොවැම්බර් මස 21 දින දරන උකස් බැඳුම්කරය මත සහ අංක 473 හා 2005 දෙසැම්බර් මස 30 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම පී. කීරගල කන්ස්ට්‍රක්ෂන් යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන කුරුවිට, කීරගල ආරච්චිලාගේ පාලිත නොහොත් කීරගල ආරච්චිලාගේ පාලිත කීරගල යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2007 නොවැම්බර් මස 01 වැනි දිනට ඉහත කී අංක 440 හා 473 දරන උකස් බැඳුම්කර මත එකී කීරගල ආරච්චිලාගේ පාලිත නොහොත් කීරගල ආරච්චිලාගේ පාලිත කීරගල යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දහඅට ලක්ෂ හැත්තෑ දෙදහස් දෙසිය තිස් එකකුත් ශත අනූහතක (රු. 18,72,231.97) මුදලක් සහ 2007 නොවැම්බර් 02 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දාහත් ලක්ෂ දහතුන් දහස් හයසිය අසූදෙකකුත් ශත විසි අටක් (රු. 17,13,682.28) සඳහා වර්ෂයකට සියයට දහතුනක (13%) අනුපාතිකය මත ගණන් බලන ලද පොලිය ද ලැබිය යුතු හා අයවිය යුතුව ඇති හෙයින් ද ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් දහඅට ලක්ෂ හැත්තෑ දෙදහස් දෙසිය තිස් එකකුත් ශත අනූ හතක (රු. 18,72,231.97) මුදල සහ 2007 නොවැම්බර් මස 02 දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දාහත් ලක්ෂ දහතුන් දහස් හයසිය අසූ දෙකකුත් ශත විසි අටක් (රු. 17,13,682.28) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) අනුපාතිකය මත ගණන් බලන ලද පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි යන්ත්‍රසූත්‍ර විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලුම වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 440 හා 473 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි යන්ත්‍රසූත්‍ර කොළඹ බලයලත් වෙන්දේසිකාර ගාමිණී දියාව මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

***අංක 440 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය***

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, දකුණු උඩපත්තුවේ, එරත්න පරතලකන්දේ පිහිටි පහලඕවිට වත්ත *නොහොත්* හතනායෙවත්ත, *නොහොත්* හතනායෙහේන *නොහොත්* වෙරළුගහහේන්යාය නමැති ඉඩමේ අංක 2741 හා 1977.05.14 දින දරන අවසාන බෙදුම් පිඹුරේ දැක්වෙන ලොට් "1සී" ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වන, උතුරට : ඉහත සඳහන් අංක 2741 දරන බෙදුම් පිඹුරේ, ලොට් 1බී දරන බිම් කට්ටිය ද, නැගෙනහිරට : ඉහත සඳහන් අංක 2741 බෙදුම් පිඹුරේ ලොට් අංක 2 දරන බිම් කට්ටිය ද, දකුණට : ඉහත සඳහන් අංක 2741 දරන බෙදුම් පිඹුරේ ලොට් 1 ඩී 1, 1ඊ, 1එෆ්, 1ජී, සහ 1 එච් දරන බිම් කට්ටි ද බස්නාහිරට : කුරුගඟ ද යන මායිම් ඇතුළත රූඩ් තුනකුත් පර්චස් එකොළහක් (අ.0, රූ. 3, ප. 11) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ලොට් "සී" සහ ලොට් "ඩී" ලෙස ලකුණු කළ ගොඩනැගිලි හා වෙනත් සියලු දේ.

මැතකදී කරන ලද මැනීමක් අනුව මෙම ඉඩම පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, දකුණු උඩ පත්තුවේ, පරතලකන්ද ග්‍රාමයේ, පිහිටි පහළ ඕවිට නොහොත් වෙරළුගහ හේන්යාය (කොටසක් ) නමැති ඉඩමේ (බලයලත් මිනින්දෝරු එල්. යූ. කන්නන්ගර විසින්, රත්නපුර දිසා අධිකරණයේ අංක 9429 දරන නඩුව සඳහා මැන සාදන ලද අංක 2741 හා 1978.03.22 දින දරන පිඹුරේ ලොට් 1 සී දරන බිම් කට්ටියට) බලයලත් මිනින්දෝරු එස්. රාමක්‍රිෂ්ණන්

විසින් මැන සාදන ලද අංක 2182/05 හා 2005.10.17 දින දරන පිඹුරේ ලොට් 1සී ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන, උතුරට: බලයලත් මිනින්දෝරු එන්. යූ. කන්නන්ගර විසින් මැන සාදන ලද අංක 2741 දරන පිඹුරේ ලොට් 1බී දරන බිම් කට්ටිය ද, නැගෙනහිරට : මහපාර දිගට ඇති රිසවේසම ද, දකුණට : බලයලත් මිනින්දෝරු එල්. යූ. කන්නන්ගර විසින් මැන සාදන ලද අංක 2741 දරන පිඹුරේ ලොට් 1ඩී, 1ඊ, 1එෆ්, 1ජී සහ 1එච් දරන බිම් කට්ටි ද බස්නාහිරට : කුරුගඟ ද යන මායිම් ඇතුළත රූඩ් තුනකුත් පර්චස් එකොළහක් (අ. 0, රූ. 3,පර්. 11) (හෙක්. 0.3313 ) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

අංක 473 දරන උකස් බැදුම්කරය මගින් උකස් කරන ලද යන්ත්‍රසූත්‍ර විස්තරය

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| කොමට්සු පීසී 120-3 එක්ස්කැවේටරය සීරියල් අංකය 18147 | එකයි |

මෙම උකස්කරු විසින් දැනට ව්‍යාපාරය කරගෙන යන සහ මින්මතු කවර හෝ වේලාවක සහ කලින් කල ව්‍යාපාරය කරගෙන යා හැකි යම් පරිශ්‍රයක සහ ගුදමක හෝ මෙකී වංචල දේපළ, පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ කලින් කල ගබඩා කරනු ලැබිය හැකි හෝ තබනු ලැබිය හැකි යම් පරිශ්‍රයක සහ ගුදමක තිබෙන අමතර කොටස්, උපාංග සහ උපකරණ මෙයට ඇතුළත් වේ.

ඒ.එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ / සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5,
ගාලුපාර.

07-27/1

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කුරුණෑගල ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක් වූ මැයි මස 22 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරණ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.හි නමට ලියන ලද්දා වූ ද 2004.01.02 වැනි දින සහ අංක 600 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පුංචිහේවගේ ජනිතා සංජීවනී යන අය ණයකාරිය හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ විසිතුන්දහස් පන්සිය පනස්දෙකයි ශත පහක (රු. 5,23,552.05) ක මුදලක් 2007.11.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,23,552.05ක මුදලට 2007.12.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 600 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩ විල්ලි හත්පත්තුවේ, කුඩාගල්බොඩ කෝරළේ, අස්වැද්දුම ගමේ පිහිටි "අස්වැද්දුම වත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් 1993.04.29 දින මැන සාදන ලද අංක 60/93 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 23 දරන ඉඩම් කොටසින් ද උතුරට : එම පිඹුරේ ලොට් අංක 18න් ද; නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් අංක 22න් ද; දකුණට: අඩි 20 ක් පළල අලකොල දෙනියේ සිට කුරුණෑගල දක්වා දිවෙන පාරෙන් ද සහ බටහිරට : එකී පිඹුරේ ලොට් අංක 24 න් ද මායිම් වූ එකී අංක 60/93 පිඹුර ප්‍රකාරව පර්චස් පහළොව (අ.0,රූ. 0,පර්. 15) ක් විශාලත්වය ඇති ඉඩම, ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ සියළු දේත් සමග වන අතර මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1246/226 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-113/1

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මාලිගාවත්ත ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක් වූ මැයි මස 22 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද පිළිවෙලින් 2004.12.13 දින සහ 2006.01.06 දිනැති අංක 1147 සහ 1487 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගයාන් මෝටර්ස් නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන දොන් මැනුවල් ගේ දොන් ජයතිස්ස ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් පනස්ලක්ෂ විසිපන්දහස් අනූහයයි ශත පනස්දෙක (රු. 5,025,096.52)ක මුදලක් 2008.03.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,025,096.52ක මුදලට 2008.04.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර

පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1147 සහ 1487 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්.එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවට අයත් බත්තරමුල්ලෙහි උප කාර්යාලයේ සීමාව තුළ උතුරු තලංගම ගමෙහි පිහිටි කඩුවෙල පාරේ වරිපනම් අංක 526 ලෙස දැක්වෙන "මිල්ලගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ජී. චන්ද්‍රසේන විසින් මැන සාදන ලද අංක 2001/126 සහ 2001 මාර්තු මස 03 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1ඒ ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : කඩුවෙල පාරෙන් ද ; නැගෙනහිරට : ලොට් 1 බී වලින් ද ; දකුණට : පිඹුරු අංක 2001/125ට අයත් ලොට් 2 න් ද සහ බස්නාහිරට: අඩි 10ක් පළලැති පාරක් සඳහා වෙන් කල කොටසින් ද (පිඹුරු අංක 2001/125 අයත් ලොට් 3න් ද) මායිම් වූ පර්චස් හයයි දශම බිංදුවයි එක (අ. 0. රූ. 0, පර්. 6.01)ක් විශාල අංක 2001/126 දරන පිඹුර ඉඩම වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1394/231 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අංක 1147 දරන උකස්බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

07-113/2

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - වැල්ලවත්ත ශාඛාව
## (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක් වූ මැයි මස 22 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්.ඩී.එන්. සමරනායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද, 2005.06.30 දින සහ අංක 201 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ෆාතිමා සිමාරා අමනුල්ලා ණයකරු සහ උකස්කරු හැටියට සහ මොහමඩ් අබුබකර් අමනුල්ලා ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස්හතරලක්ෂ අසූදහස් හත්සිය අටයි ශත තිස්හතක (රු. 44,80,708.37) මුදලක් 2008.04.10 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 44,80,708.37ක මුදලට 2008.04.11 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 201 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගරසභා සීමාව තුළ දෙහිවල අංක 10 වසම, නැදිමාලෙහි පිහිටි ගල්වල පාරේ, වරිපනම් අංක 265ඒට අයත් අඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ජේ. එම්.ඩබ්. සමරනායක විසින් මැන සාදන ලද අංක 829 සහ 1997 නොවැම්බර් මස 10 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස (මෙය බලයලත් මානක එස්.එච්.පී.කෝට්ටේගොඩ විසින් මැන සාදන ලද 1996.01.25 දිනැති අංක 1177 දරන පිඹුරේ ලොට් ඒ1 හි නැවත මැනීමක් හා ඒකාබද්ධ කිරීමක් සහ බලයලත් මානක ජේ.ටී. අයි.අබේකෝන් විසින් මැන සාදන ලද අංක 1994.04.05 දිනැති අංක 983 දරන පිඹුරේ ලොට් 1බී හි ඉතිරි කොටසක් වේ.). උතුරට : ගල්වල පාරේ, වරිපනම් අංක 263ට අයත් අංක 1177 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1බී1න් ද; නැගෙනහිරට : ගල්වල පාරේ, වරිපනම් අංක 263න් ද ; දකුණට: ගල්වල පාරේ, වරිපනම් අංක 263 සහ 265 න් ද සහ බස්නාහිරට : ගල්වල පාරෙන් ද මායිම් වූ එකී අංක 829 දරන පිඹුරට ප්‍රකාරව පර්චස් එකොළහයි දශම එකයි පහක (අ. 0, රූ. 0, පර්. 11.15) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි අටයි දෙක (හෙක්. 0.0282) ක් විශාල ඉඩම් කොටස මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2753/59 දරන ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

07-113/6

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - සී ස්ට්‍රීට් ශාඛාව
## (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක් වූ මැයි මස 22 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ඩී. සිල්වා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද, 2005.04.21 වැනි දින සහ අංක 1473 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, තුඩුගලගේ සංජීව දිලීප මුණසිංහ ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් නවලක්ෂ තිස්එක්දහස් පන්සිය හැත්තෑතුනයි ශත හැත්තෑනවය (රු. 9,31,573.79) මුදලක් 2008.03.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 9,31,573.79ක මුදලට 2008.04.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1473 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ, අතුරුගිරියෙහි පිහිටි අතුරුගිරිය කොටසට අයත් ඇටඹගහලන්ද නමැති ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේ අයත් ඉඩමට බලයලත් මානක එම්.සමරනායක විසින් මැන සාදන ලද අංක 9326 සහ 2005 පෙබරවාරි මස 15 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 2 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : කාරියවසම්ට අයත් ඉඩම අංක 1069 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 න් ද සහ ජගත් ගුණසේකරට අයත් ඉඩම අංක 402 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ 2න් ද ; නැගෙනහිරට : ජගත් ගුණසේකරට අයත් ඉඩම අංක 402 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ 2න් ද සහ ගුණසේකර මාවතෙන් ද, (පිඹුරු අංක 506 හි ලොට් 8න් ද ); දකුණට : ගුණසේකර මාවතෙන් ද (පිඹුරු අංක 506 ට අයත් ලොට් 8න් ද) සහ පී. එස්. පෙරේරාට අයත් ඉඩම අංක 402 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ6 සහ ඒ7 වලින් ද සහ අංක 4494 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ වලින් ද සහ බස්නාහිරට : අංක 402 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ6 සහ ඒ 7න්ද සහ පී. එස්. පෙරේරාට අයත් ඉඩම අංක 4494 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ වලින් ද සහ කාරියවසම්ට අයත් ඉඩම අංක 1069 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1න් ද මායිම් වූ පර්චස් විස්සයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 20.75)ක් විශාල ඉඩම් කොටස හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 9326 දරන පිඹුර ජී 821/332 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ඩී. සිල්වා විසින් මැන සාදන ලද අංක 1473 දරන උකස් බැදුම්කරයේ දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-113/7

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - හල්ස්ඩ්‍රොප් ශාඛාව
## (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක් වූ මැයි මස 22 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද පිළිවෙලින් 2003.11.07 වැනි දින සහ 2004.03.23 වැනි දින සහ අංක 1910 සහ 2024 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්.එස්. හල්ඹෑව විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද, 2005.12.02 වැනි දින සහ අංක 1519 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම , අසේල කුමාරගුප්ත සුමනසූරිය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස්නව ලක්ෂ අසූඅටදහස් පන්සියහතයි ශත තිස්හයක (රු. 49,88,507.36) ක මුදලක් 2008.02.29 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 49,88,507.36 මුදලට 2008.03.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1910, 2024 සහ 1519 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවෙහි, ගංගොඩවිල පිහිටි කොළඹ පාර, වරිපනම් අංක 485/18 දරන බණ්ඩාරදෙනියඹිවිට සහ ඉදිගහඹිවිට නමැති ඉඩමට බලයලත් මානක ඒ.ආර්.සිල්වා විසින් මැන සාදන ලද 2002.09.06 දිනැති අංක 1318 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් වයි 1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : අංක 7225ඒ දරන පිඹුරේ ලොට් එක්ස් වලින් ද ; නැගෙනහිරට : අඩි 20ක් පළලැති පාරෙන් ද (අංක 1065 දරන පිඹුරේ ලොට් බී) ; දකුණට : ලොට් වයි 2 වලින් ද සහ බස්නාහිරට : අංක 7225ඒ දරන පිඹුරේ ලොට් එක්ස් වලින් ද මායිම් වූ එකී අංක 1318 දරන පිඹුර ප්‍රකාරව පර්චස් අටයි දශම දෙකයි බිංදුව (අ. 0,රූ. 0, පර්. 8.20)ක විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2398/243 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 1910, 2024 සහ 1519 දරන උකස් බැඳුම්කරවල දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති පාරක් සඳහා වෙන් කරන ලද බලයලත් මානක බී. සී. අමේන්ද්‍ර විසින් මැන සාදන ලද 1969.12.25 දිනැති අංක 1065 දරන පිඹුරේ ලොට් බී මතින් මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-113/5

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මාලිගාවත්ත ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක් වූ මැයි මස 22 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද 2006.09.29 දින සහ අංක 2463 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම , දොන් මැනුවල් ගේ දොන් ජයතිස්ස ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් දහතුන්ලක්ෂ පන්දහස් හාරසිය තිස්දෙකයි ශත විසිඑක (රු. 13,05,432.21) ක මුදලක් 2008.02.29 දින වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 13,05,432.21ක මුදලට 2008.03.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2463 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මාලබේ ගමෙහි පිහිටි "දවටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක එන්. හේරත් විසින් මැන සාදන ලද අංක 2006/46ඒ සහ 2006 ජනවාරි මස 30 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 19 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 20න් ද ; නැගෙනහිරට : ලොට් ආර්. 1න් ද ; දකුණට : ලොට් 18 න් ද සහ බස්නාහිරට : අංක 1336 දරන පිඹුරේ ලොට් 8න් ද මායිම් වූ පර්චස් දහය (අ.0, රූ.0, පර්. 10) ක් විශාල අංක 2006/46ඒ දරන පිඹුර ඉඩම වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුමේ/පත්ඉරුවේ ජී 1674/99 යටතේ ලියාපදිංචි කර ඇත.

පිඹුරු අංක 2006/46ඒ හි දැක්වෙන ලොට් ආර්1 සිට ආර් 4 දක්වාත්, 2002 මාර්තු මස 17 දිනැති පිඹුරු අංක 1336 හි දැක්වෙන පරිදි ලොට් 7, 8 සහ 9 ලෙස දැක්වෙන කැබලි මතින් මාර්ග අයිතිය ද කාණු භාවිතා කිරීමේ අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

07-113/4

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මාලිගාවත්ත ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක් වූ මැයි මස 22 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද 2006.12.09 දින සහ අංක 2670 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම , දොන් මැනුවෙල් ගේ දොන් ජයතිස්ස ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිහයලක්ෂ තිස්අටදහස් අටසිය එකළොහයි ශත අනූනමය (රු. 26,38,811.99) ක මුදලක් 2008.02.29 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 26,38,811.99ක මුදලට 2008.03.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2670 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලෙ පත්තුවේ, කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ මුල්ලේරියාවෙහි පිහිටි තලංගම පටුමගෙහි, වරිපනම් අංක 50/1හි "කුඩළු අගර කුඹුර" නමැති ඉඩමට බලයලත් මානක ජී. එම්. කමල් පෙරේරා විසින් මැන සාදන ලද අංක 94/2006 සහ 2006 මැයි මස 24 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 3 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට: පාරෙන් ද (ප්‍රාදේශීය සභා) ; නැගෙනහිරට : ලොට් 2න් ද ; දකුණට: පිට වේල්ලෙන් ද සහ බස්නාහිරට : ලොට් 4 න් ද මායිම් වූ පර්චස් අටක (අ.0, රූ.0, පර්. 8) ක් විශාල අංක 94/2006 දරන පිඹුර ප්‍රකාර ඉඩම වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුමේ / පත් ඉරුවේ එල් 118/84 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ මුල්ලේරියාවෙහි පිහිටි තලංගම පටුමගෙහි, වරිපනම් අංක 50/4හි "කුඩළු අගර කුඹුර" නමැති ඉඩමට බලයලත් මානක ජී. එම්. කමල් පෙරේරා විසින් මැන සාදන ලද අංක 94/2006 සහ 2006 මැයි මස 24 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 4 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට: පාරෙන් ද (ප්‍රාදේශීය සභා ) ; නැගෙනහිරට : ලොට් 3 න් ද ; දකුණට : පිට වේල්ලෙන් ද සහ බස්නාහිරට : ලොට් 5 න් ද මායිම් වූ පර්චස් අටක (අ. 0, රූ.0,පර්. 8) ක විශාල අංක 94/2006 දරන පිඹුර ප්‍රකාර ඉඩම වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුමේ/පත්ඉරුවේ එල් 118/85 යටතේ ලියාපදිංචි කර ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ මුල්ලේරියාවෙහි පිහිටි තලංගම පටුමගෙහි, වරිපනම් අංක 50/5 හි "කුඩළු අගර කුඹුර" නමැති ඉඩමට බලයලත් මානක ජී. එම්.කමල් පෙරේරා විසින් මැන සාදන ලද අංක 94/2006 සහ 2006 මැයි මස 24 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 6 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට: පාරෙන් ද (ප්‍රාදේශීය සභා ) ; නැගෙනහිරට : ලොට් 5 න්ද ; දකුණට : පිට වේල්ලෙන් ද සහ බස්නාහිරට : යූ. විදානගමගේ හිමිකම් කියන ඉඩමෙන් ද මායිම් වූ පර්චස් දහයයි දශම දෙකයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 10.20) ක් විශාල අංක 94/2006 දරන පිඹුර ප්‍රකාර ඉඩම වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුමේ/ පත්‍රිරුවේ එල් 118/86 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-113/3

---

### ඩීඑෆ්සීසී වර්ධන බැංකුව

1990 අංක දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ :

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. හපුතන්තිරි විසින් ලියා සහතික කරන ලද අංක 313 හා 2006 ජූලි මස 27 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම මහනුවර මැද බෝවල ටිකිතන්තිරි මහසාමිලාගේ පණ්ඩුල ගුණසේකර නොහොත් ටිකිතන්ත්‍රි මහසාමිලාගේ පණ්ඩුල ගුණසේකර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 ජනවාරි මස 31 දිනට ඉහත කී අංක 313 දරන උකස් බැඳුම්කරය මත එකී ටිකිතන්තිරි මහසාමිලාගේ පණ්ඩුල ගුණසේකර නොහොත් ටිකිතන්ත්‍රි මහසාමිලාගේ පණ්ඩුල ගුණසේකර යන අයගෙන් ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් තිස් එක්ලක්ෂ හතලිස්පන් දහස් පන්සිය හැත්තෑ එකකුත් ශත අනූදෙකක (රු. 31,45,571.92) මුදලක් සහ 2008 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් පොලිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තිස්එක් ලක්ෂ හතලිස්පන් දහස් පන්සිය හැත්තෑ එකකුත් ශත අනූදෙකක (රු. 31,45,571.92) මුදල සහ 2008 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් පොලිය ද, මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 313 දරන උකස් බැඳුම්කරය සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 313 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගරය සහ මහනගර සභා සීමාව ඇතුළත, මාපානවතුරේ පිහිටි, ගැටගහමුලේවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. නානායක්කාර විසින් මැන සාදන ලද අංක 648 හා 1989 දෙසැම්බර් මස 20 වැනි දින දරන පිඹුරේ ලොට් 1බී ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 1 (ලොට් අංක 1හි දකුණු පැත්තේ පැළඉණි වැට) ද, නැගෙනහිරට : ලොට් 1ඒ දරන බිම් කට්ටිය ද, දකුණට : ලොට් 2 ද, බස්නාහිරට : වට්ටාරාන්තැන්න වත්ත ද යන මායිම් ඇතුළත, එකී අංක 648 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිපහකුත් දශම පහක් (අ. 0, රූ. 0, පර්. 25.5) විශාලත්වය ඇති ඉඩමේ බිම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර සභා සහ මහනගර සභා සීමාව ඇතුළත, මාපානවතුරේ පිහිටි ගැටගහමුලේවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු පී. නානායක්කාර විසින් මැන සාදන ලද අංක 648 හා 1989 දෙසැම්බර් මස 20 වැනි දින දරන පිඹුරේ ලොට් 1බී ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන, බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් 1බී සහ 1ඒ දරන බිම් කට්ටිය ද, නැගෙනහිරට : මාපානවතුර පාර ද, දකුණට : ලොට් 3බී සහ ලොට් 3ඒ දරන බිම් කට්ටිය ද, බස්නාහිරට : වට්ටාරන්තැන්න වත්ත ද යන මායිම් ඇතුළත එකී අංක 648 දරන පිඹුර ප්‍රකාර, පර්චස් තිස් හතරක් (අ. 0, රූ. 0, පර්. 34) විශාලත්වය ඇති ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

3. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගරය සහ මහ නගර සභා සීමාව ඇතුළත, මාපානවතුරේ පිහිටි ගැටගහමුලේවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. නානායක්කාර විසින් මැන සාදන ලද අංක 648 හා 1989 දෙසැම්බර් මස 20 වැනි දින දරන පිඹුරේ ලොට් 3බී ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන, බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 2 ද, නැගෙනහිරට : ලොට් අංක 3ඒ දරන බිම් කට්ටිය ද, දකුණට : අපුල්ලන හේනයලාගේ වත්ත සහ ගැටගහමුල වත්තේ ඉතිරි කොටස ද, බස්නාහිරට : වට්ටාරන්තැන්න වත්ත ද යන මායිම් ඇතුළත එකී අංක 648 දරන පිඹුර ප්‍රකාර, පර්චස් විසිනවයකුත් දශම

පහක් (අ. 0, රූ. 0, පර්. 29.5) විශාලත්වය ඇති ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

එල්. ජී. පෙරේරා,
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

07-86/1

---

ජේ 31

සමාගම් 11

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ඕල් සිලෝන් රයිස් මිලර්ස් ඇසෝසියේෂන් " හි නම කපා හැරීමේ දැන්වීම.

1938 අංක 51 දරන වෙළඳ සමාගම් ආඥාපනතේ (145 අධිකාරය) විධිවිධාන යටතේ 1970.04.07 දින සංස්ථාපිත සමාගමක් වන "ඕල් සිලෝන් රයිස් මිලර්ස් ඇසෝසියේෂන් " ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ඕල් සිලෝන් රයිස් මිලර්ස් ඇසෝසියේෂන් " නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,

2008 ජුනි මස 12 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-07

---

**ලංකා බැංකුව- රිදීගම**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

2006.08.16 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් එඩ්මන්ඩ් කුලරත්න විසින් සහතික කරන ලද 2005.05.05 දිනැති අංක 9273 දරන උකස් බැඳුම්කරය මත මුල් මුදල හා 2006.05.05 දින තෙක් පොලිය වශයෙන් රුපියල් දෙලක්ෂ දාසය දහස් දෙසිය අනූඅටයි ශත හැට අටක (රු. 2,16,298/68) මුදලක් සමග රුපියල් එක්ලක්ෂ අනූහත් දහස් පන්සිය හැටහතරයි ශත අනූපහක (රු. 1,97,564/95) මුදලක් මත වසරකට සියයට දාහත (17%) බැගින් පොළියක්, 2006.05.06 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කලුගල්ල, තරුණ ගොවිපල, නිකදළුපොත හි පදිංචි රම්පටිදේවගේ කුමාර වික්‍රමසිංහ මහතා, නන්එදිරි දේවගේ චිත්‍රා කුමාරි මහත්මිය සහ රම්පටි දේවගේ ජූලිස් සෝමරත්න මහතා යන අයගෙන් එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසුව, ණයකරු විසින් 2008.05.07 දින තෙක් අයවියයුතු මුදලින් ණය වාරික හා පොළිය වශයෙන් රු. 1,83,028/46 ක් හා රු. 31,748/09 ක මුදලක් තැන්පත් කර ඇත.

2. එකී අංක 9273 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ඉහත '1' හි සඳහන් මුදල සමඟ විකිණීමේ දිනය තෙක් ඉහතකී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු සහ මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිරියාල හත්පත්තුවේ දිවිගන්දහය කෝරළයේ, වෙලන්ගොල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ වෙලන්ගොල්ල ග්‍රාමයේ පිහිටි "වෙලන්ගොල්ල" නැමැති ඉඩම් කැබැල්ල සර්වේයර් ජනරාල් විසින් සාදන ලද අංක 1956 දරන පිඹුරේ ලොට් අංක 81 වශයෙන් කළ හා ඔහුගේ භාරයේ තබා ඇති හෙක්ටයාර් එකයි දශම දෙකයි අටයි බිංදුවක (හෙක්ටයාර් 1.280) ප්‍රමාණයෙන් යුත් ඉඩමේ මායිම් නම්, *උතුරට* : ලොට් 20 ද, *නැගෙනහිරට* : ලොට් 82 සහ 83 ද, *දකුණට* : පාරක්වූ ලොට් 85 ද, *බස්නාහිරට* : ලොට් 80 ද, සහ එම මායිම් තුළ පිහිටි ගහ කොළ, වැවිලි සහ සියලුදේ වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO. B 92/5565/97 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

කේ. ජී. ටී. අමරසිංහ,
කළමනාකරු.

ලංකා බැංකුව,
රිදීගම ශාඛාව.

07-49

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0205500286

ණයකරුගේ සම්පූර්ණ නම : ලියනගේ මනෝජ් අසංක රත්නායක.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඩී. ටී. ගුණවර්ධන විසින් ලියා සහතික කරන ලද 2185 හා 2004.09.30 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු "බැංකුව " යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්‍ෂ තිස්හතර දහස් තුන්සිය පනස් හතයි ශත පනහක (රු.334,357.50) මුදලක් වර්ෂ 2006.09.30 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තුන්ලක්ෂ දෙදහස් අටසිය හතළිහයි ශත අනූනවයක (රු.302,840.99) මුදලද වර්ෂ 2006.09.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්එක් දහස් පන්සිය දාසයයි ශත පනස් එකක් (රු.31,516.51) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ තිස් හතරදහස් තුන්සිය පනස් හතයි ශත පනහක (රු.334,357.50) ද,

(2) එකී රුපියල් තුන්ලක්ෂ දෙදහස් අටසිය හතළිහයි ශත අනූනවයක (රු.302,840.99) මුදල මත අයවිය යුතු වර්ෂයකට 12.50% බැගින් වන පොළියක් 2006.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩුකොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම් (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ දෙසැම්බර් මස 01 දින පැවති අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ, අළුත්කුරු කෝරළේ, මිනුවන්ගොඩ, ප්‍රාදේශීය සභා සීමාවේ අස්ගිරිවල්පොල ග්‍රාමයේ කටුගස්තොට පාරේ වරිපනම් අංක 225/4 හි පිහිටි දෙල්ගහවත්ත නැමැති ඉඩමට 2004.04.29 දින එස්. පී. එන්. සඳගිරි මානක තැන විසින් මැන සම්පාදිත අංක 1048 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට : ආර්. එස්. පෙරේරාගේ ඉඩම ද, නැගෙනහිරට : එම්. ඩේවිඩ්ගේ ඉඩම ද, දකුණට: එල්.යූ. එස්. රත්නායකගේ ඉඩමද, පාර සහ එම ඉඩමේම ඉතිරි කොටස ද, බටහිරට : ඒ. එම්. පී. අල්ගමගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතයි දශම තුනයි බිංදුවක් (අක්කර 0, රූඩ් 0, පර්. 17.30) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවයද , සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ337/39හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

07-107

---

### සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. පුංචිහේවා විසින් ලියා සහතික කරන ලද අංක 7337 හා 2004.11.24 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ගෝල් විං ඒජන්සීස් යන නාමය, අභිධානය යටතේ ගාල්ලේ ව්‍යාපාරය කරගෙන යන හේමචන්ද්‍ර උඩුමලගල සහ උඩුමලගල ආචාරිගේ පර්සි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2007 ඔක්තෝබර් මස 31 වැනි දිනට ඉහත කී අංක 7337 දරන උකස් බැඳුම්කරය මත එකී හේමචන්ද්‍ර උඩුමලගල සහ උඩුමලගල ආචාරිගේ පර්සි යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් එකොලොස් ලක්ෂ දහහතර දහස් පන්සිය තිස්පහකුත් ශත අසූපහක (රු. 11,14,535.85) මුදලක් සහ 2007 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට තිස් හය (36%) බැගින් පොළිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් එකොලොස් ලක්ෂ දහහතර දහස් පන්සිය තිස්පහකුත් ශත අසූපහක (රු. 11,14,535.85) මුදල සහ 2007 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් පොළිය ද, මීට අදාළ ඉඩම හා පරිශ්‍රය එහි පිහිටි ගොඩනැගිලි ද සමග විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියළු මුදල් හා දරා ඇති සියළු වියදම් හා ගාස්තු සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 7337 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර තිබෙන මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 7337 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, උතුරු කළුතර තොටමුණේ, කළුතර බද්දේ, මහ හීනටියන්ගල පිහිටි (කළුතර දිසා අධිකරණයේ අංක 23352 දරන නඩුවට ගොනුකර තිබෙන, බලයලත් මිනින්දෝරු ටී. එෆ්. කොලට් විසින් මැන සාදන ලද අංක 4288 ඒ සහ 1946.11.11 දින දරන පිඹුරේ දැක්වෙන) කළුතර දිසා අධිකරණයේ අංක 29211 දරන නඩුවට ගොනුකර තිබෙන, බලයලත් මිනින්දෝරු ඩී. බී. රාජපක්ෂ විසින් මැන සාදන ලද අංක 3925 හා 1954.04.04 දින දරන පිඹුරේ දැක්වෙන දම්මුල්ලේ වත්ත, පරණ වත්ත නොහොත් දම්මුල්ලේවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. ඒ. සෙන්ට් බීඩ් සමරසිංහ විසින් මැන සාදන ලද අංක 1779 හා 1981 ජූලි 26 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 2 දරන බිම් කට්ටිය වන උතුරට : මෙම ඉඩමේ ලොට් අංක 1 දරන කට්ටිය ද, නැගෙනහිරට : (අඩි තුනක් පළල) අඩි පාර ද, දකුණට : ලොට් අංක 3 දරන බිම් කට්ටිය ද, බස්නාහිරට : (අඩි දොළහක් පළල පාරක් සඳහා වෙන් කළ) ලොට් අංක 6 ද, යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් විසි දෙකක් (අ. 0, රූ. 1, පර්. 22) විශාලත්වය ඇති ඉඩම වේ. මෙයට ඉහත සඳහන් අංක 1779 දරන පිඹුර ප්‍රකාර (ඉහත කී මහහීනටියන්ගල පිහිටි දම්මුල්ලේ වත්ත, පරන වත්ත නොහොත් දම්මුල්ලේ වත්ත නමැති ඉඩමේ (අඩි 12ක් පළල පාරක් සඳහා වෙන් කළ) ලොට් අංක 6 දරන උතුරට : අඩි පාර සහ ටී. පී. අංක 67909 සහ 109639 දරන පිඹුරුවල දැක්වෙන ඉඩම් ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 4 සහ 1, 2 සහ 3 ද, දකුණට : මෙම ඉඩමේ ලොට් අංක 4 ද, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් අංක 4 සහ 5 ද යන මායිම් ඇතුළත පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාලත්වය ඇති බිම් කට්ටිය මතින් මාර්ග අයිතිය ද ඇතුළත් වේ. මෙම ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

එල්. ජී. පෙරේරා,
කළමණාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ.

07-86/2

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 23188 හා 2005.10.07 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම් "පී. ඒ. එස්. ඩී. සමූහ ව්‍යාපාරය" යන නාමය අභිධානය හා ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයන් ලෙස කල්එළියේ ව්‍යාපාරය කරගෙන යන කල්එළියේ පදිංචි පිලිප්පු ආරච්චිගේ සමන්ත දිසානායක සහ ලොකු ගමගේ චන්ද්‍රානි මානෙල් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 පෙබරවාරි මස 29 දිනට ඉහත කී අංක 23188 දරන උකස් බැඳුම්කරය මත එකී පිලිප්පු ආරච්චිගේ සමන්ත දිසානායක සහ ලොකු ගමගේ චන්ද්‍රානි මානෙල් යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එකොළොස් ලක්ෂ හාරදහස් පනස් හතකුත් ශත හතලිස් හයක් (රු. 11,04,057.46) සහ 2008 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් නවලක්ෂ පනස් පන්දහස් තුන්සිය පනස් එකක් (රු. 9,55,351) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් එකොළොස් ලක්ෂ හාරදහස් පනස් හතකුත් ශත හතලිස් හයක් (රු. 11,04,057.46) මුදල සහ 2008 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් නවලක්ෂ පනස් පන්දහස් තුන්සිය පනස් එකක (රු. 9,55,351) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩී.එෆ්.සී.සී. බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද, සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 23188 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1995 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 23188 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, හාපිටිගම් කෝරළේ, යටිගහ පත්තුවේ හාපිටිගම ග්‍රාමයේ පිහිටි මැලේහේන සහ ඉහලවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එන්. ඒ. ස්මිත් විසින් මැන සාදන ලද අංක 1774/67 හා 1963.10.25 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 5 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වන උතුරු-බස්නාහිරට : අඩි 15ක් පළල පාරක් සඳහා වෙන් කළ බිම ද, උතුරු-නැගෙනහිරට : ලොට් අංක 8 ද, දකුණු-නැගෙනහිරට : ලොට් අංක 6 ද, දකුණු-බස්නාහිරට : කැලණිය සිට බටලීයට යන මහ පාර ද, මායිම් ඇතුළත පර්චස් තිහක් (අ. 0, රූ. 0, පර්. 30) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

මෑතක දී කරන ලද මැනීමක් අනුව එම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ-

ඉහත කී හාපිටිගම ග්‍රාමයේ පිහිටි මැලේහේන සහ ඉහලවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් මැන සාදන ලද

අංක 7336ඒ සහ 1998.03.12 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරු-බස්නාහිරට : මහපාරේ සිට ගෙවල්වලට යන පාර ද, උතුරු-නැගෙනහිරට : ඉහත කී අංක 1774/67 දරන පිඹුරේ ලොට් අංක 8 ද, දකුණු-නැගෙනහිරට : එකී අංක 1774/67 දරන පිඹුරේ ලොට් අංක 6 ද, දකුණු-බස්නාහිරට : කැලණියේ සිට බටලීයට යන මහ පාර ද, යන මායිම් ඇතුළත පර්චස් තිහක් (අ. 0, රූ. 0, පර්. 30) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

මෙයට ඉහත කී අංක 1774/67 දරන පිඹුරේ ලොට් අංක 18 ලකුණු කළ පාර පාවිච්චි කිරීමේ අයිතිය ද ඇතුළත් වේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂක/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5 ගාලු පාර,
කොළඹ.

07-85/2

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංක පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1970004634.
ණය ගිණුම් අංක : 208414 සහ 205418.

2008 අප්‍රේල් මස 04 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් සහතික කරන ලද්දා වූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් දැනට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද, 2004 අගෝස්තු මස 14 වැනි දින හා අංක 1544 හා 1545 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම යටලවත්ත විලේගොඩ ආරච්චිගේ චන්ද්‍රලාල් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පනස්හයලක්ෂ පනස් අට දහස් අටසිය හතලිස් පහයි ශත තිස් අටක (රු. 56,58,845.38) මුදලක් 2007 නොවැම්බර් මස 14 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පනස් හය ලක්ෂ පනස් අට දහස් අටසිය හතලිස් පහයි ශත තිස් අටක (රු. 56,58,845.38) මුදල සහ 2007 නොවැම්බර් මස 15 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 28,45,673.41ක මුදල මත 14% ක සහ රු. 15,47,850ක මුදල මත 20%ක වැඩිදුර වාර්ෂික පොළී ප්‍රමාණයක් ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත්, අඩුකොට එකී අංක 1544 සහ 1545 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස්කොට ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ප්ස්ඩෝර්ප් වීදියේ, අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි අංක 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### උපලේඛනය

(1) බලයලත් මානක ඩී. ජී. මෙන්ඩිස් විසින් 1997 අප්‍රේල් මස 03 වැනි දින සාදන ලද අංක 4524 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වළල්ලාවිට කෝරළයේ, බෙන්තොට කොස්ගොඩ, නාපේ පිහිටි ඇටවලේවත්ත ඉඩමේ ගොඩනැගිලි වගාවන් සහ සියළුදේත් සමඟ බෙදා වෙන් කරන ලද ලොට් අංක 1 දරන ඉඩමට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් 3 දරන පාරක් සඳහා වෙන් කරන ලද කොටස ද. නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 2 දරන කොටස ද, දකුණට : අදිරියන්ද සොයිසා අප්පුහාමිගේ වත්ත ද සහ බස්නාහිරට : කොළඹ සිට ගාල්ල දක්වා ඇති මහා මාර්ගයද යන මායිම් තුළ පර්චස් තිස්හතක් (අ. 0, රූ. 0, පර්. 37) ක් විශාල ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී208/281 දරන වෙළුමේ පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

(2) එකී අංක 4524 දරන පිඹුර පරිදි එකී කොස්ගොඩ නාපේ පිහිටි ඇටවලේවත්ත ඉඩමේ ගොඩනැගිලි, වගාවන් සහ සියලුදේත්, සමඟ බෙදා වෙන් කරන ලද ලොට් 2 දරන ඉඩමට මායිම්, උතුරට : සිසිලියන්ද සොයිසා අප්පුහාමිගෙවත්ත සහ පින්වත්ත ද, නැගෙනහිරට : ලස්සින්නගේ වත්ත ද, දකුණට : අදිරියන්ද සොයිසා අප්පුහාමිගේ වත්ත ද, සහ බස්නාහිරට : පාරක් සඳහා වෙන් කරනල ද ලොට් 1 සහ 3 ද යන මායිම් තුළ පර්චස් තිස්හතක් (අ. 0, රූ. 0, පර්. 37)ක් විශාල ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 208/282 දරන වෙළුමේ පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

(3) සම්පූර්ණ නිදහසේ ඇවිදීමේ අයිතිය, ඇතුල්වීමේ සහ පිටවීමේ අයිතිවාසිකම්, යෑම් ඒම් කිරීමේ අයිතිය, ඉදිකිරීම්, විදුලිය සවිකිරීම්, උඩින් සහ යටින් ජල පහසුකම් ලබා ගැනීම ආදී සියලු අයිතිවාසිකම් බෙදා වෙන් කරන ලද පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 3 දරන කොටස තුළ හිමිකම් ඇත. එකී කොස්ගොඩ නාපේ පිහිටි ඇටවලේවත්ත ඉඩමේ පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 3ට මායිම්, උතුරට : සිසිලියන්ද සොයිසා අප්පුහාමිගේ වත්ත ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 2 ද, දකුණට : එම ඉඩමේ ලොට් 1 ද, සහ බස්නාහිරට : කොළඹ-ගාල්ල මහා මාර්ගය ද යන මායිම් තුළ පර්චස් හතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 4.5)ක් විශාල ඉඩම් කොටස බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 218/283 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

**අංක 4524 දරන මිනුම් පිඹුර අනුව මෙම දේපළ මෙසේ විස්තර කර ඇත.**

එකී නාපේ පිහිටි ඇටවලේවත්ත (දැනට ලොට් 1, 2 සහ 3 වශයෙන්) ඒකාබද්ධ කොට ඇත. (එකී ලොට් 1, 2 සහ 3 ) සඳහා මායිම්, උතුරට: සිසිලියන් ද සොයිසා අප්පුහාමිගේ වත්ත සහ පින්වත්ත ද, නැගෙනහිරට : ලස්සිනාගේ වත්ත ද, දකුණට : අදිරියන් ද සොයිසා අප්පුහාමිගේවත්ත ද, බස්නාහිරට : කොළඹ සිට ගාල්ල දක්වා ඇති මහා මාර්ගය ද යන මායිම් තුළ පර්චස් තිස් අටයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 38.5) විශාල ඉඩම වේ.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගමේ/ලේකම්.

07-102

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0114400771.

ණයකරුගේ සම්පූර්ණ නම : මුතුමුනි බන්දුල විජේරත්න සිල්වා.

අළුත්ගම ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. ඩී. ඩී. ගුණවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 609 හා 1999.01.22 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ දහතුන්දහස් දෙසීය දහයයි ශත හැටහයක (රු. 1,13,210.66) මුදලක් වර්ෂ 2005.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූපන්දහස් හත්සිය අනූඑකයි ශත විසිනවයක (රු. 95,791.29) මුදල ද වර්ෂ 2005.12.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් දාහත්දහස් හාරසිය දහනවයයි ශත තිස්හතක් (රු. 17,419.37) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ දහතුන්දහස් දෙසීය දහයයි ශත හැටහයක (රු. 1,13,210.66) ද,

(2) එකී රුපියල් අනූපන්දහස් හත්සිය අනූඑකයි ශත විසිනවයක (රු. 95,791.29) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.50% බැගින් වන පොළියක් 2006.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ පෙබරවාරි මස 23 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු කළුතර තොටමුණේ, බේරුවල බැද්දෙහි හෙට්ටිමුල්ල හි බේරුවල (මාලේවන් බැද්ද උප කාර්යාල සීමාවේ) ප්‍රාදේශීය සභා සීමාවේ, වදකහවෙල ග්‍රාමයෙහි පිහිටි ගොඩියාඕවිට වත්ත නමැති ඉඩමට 1995.03.01 දින ඩබ්. සෙනෙවිරත්න මානක තැන විසින් මැන සම්පාදිත අංක 7800ඒ පිඹුරු ප්‍රකාර ලොට් 4ට මායිම්, උතුරට : ලොට් 5 සහ ලොට් 1 ද, නැගෙනහිරට : ඉදිගහ ඕවිට කට්ටිය ද, දකුණට : තුන්වෙනියා ඕවිට වත්ත සහ බටහිරට : ලොට් 3 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 213/161හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

07-108

---

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1047 5000 2714.

2007 නොවැම්බර් මස 28 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පානදුර, අළුබෝමුල්ල එස් මහින්ද මාවත, අංක 7/409හි කුමාරගෙවත්තගේ ලංකානි සඳුනි නිරෝෂා ප්‍රනාන්දු යන අය බන්ධනදායී වශයෙන්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලංසූරිය විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2006 දෙසැම්බර් මස 19 දාතම හා අංක 529 දරන උකස් බැඳුම්කරය මත මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම් පැහැර හැරීමේ හේතුවෙන් 2007 ජූලි මස 06 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අටලක්ෂ එකොලොස් දහස් නවසියයකුත් ශත හැට අටක් (රු. 8,11,900.68ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හා හිඟව ඇති හෙයින්, එකී රුපියල් අටලක්ෂ එකොලොස් දහස් නවසියයකුත් ශත හැට අටක් (රු. 8,11,900.68ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හත්ලක්ෂ පනස් දහසක (රු. 7,50,000ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට පහළොව (15%) බැගින් 2007 ජූලි මස 07 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමඟ ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමඟ, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 529 දරන උකස් බැඳුම්කරය මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබැද්දේ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පිංවල පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. ඒ. විජේසූරිය විසින් සාදන ලද 1992 පෙබරවාරි මස 06 දාතම හා අංක 14 දරන පිඹුරේ නිරූපිත ලොට් 32 වශයෙන් ලකුණු කොට දක්වා ඇති පානදුර

ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව F361/302 යටතේ ලියාපදිංචි කළ එකී අංක 14 පිඹුරට අනුව, උතුරට : එකී අංක 14 පිඹුරේ ලොට් 31 ද, නැගෙනහිරට : එකී අංක 14 දරන පිඹුරේ ලොට් 49 (අඩි 20 පළල පාරට වෙන්කළ කොටස්) ද, දකුණට : එකී අංක 14 දරන පිඹුරේ ලොට් 43 ද, සහ බටහිරට : දෙල්ගහවත්ත ද මායිම් වන, ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම පහයි තුනක් (අ. 0, රූ. 0, පර්. 10.53) වූ බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියළු දේ සහ එයට අදාල සියළුම අයිතීන් මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්ව ද සමග සහ පානදුර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව F 290/239හි ලියාපදිංචි කොට ඇති එකී අංක 14 දරන පිඹුරේ ලොට් 49 බිම් කොටස මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-104/2

---

### ලංකා බැංකුව- නාත්තන්ඩිය ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008.03.18 වැනි දින පවත්වනලද රැස්වීමකදී ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් පී. ඩී. ඒ. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2004.02.19 දිනැති අංක 5182 දරන උකස් බැඳුම්කරය මත මුල් මුදල හා 2007.12.27 දින තෙක් පොළිය වශයෙන් ණය ගිණුම මත රුපියල් තුන්ලක්ෂ අනූදෙදහස් දෙසිය තිස්තුනයි ශත විසිදෙකක (රු. 3,92,233.22) සහ අයිරා ගිණුම මත රුපියල් එක්ලක්ෂ දහඅට දහස් අටසිය විසිඑකයි ශත අසූහතරක (රු. 1,18,821.84) මුදලක් සමග රුපියල් දෙලක්ෂ අසූතුන්දහස් දෙසීය අනූවක් (රු. 2,83,290) සහ රුපියල් එක්ලක්ෂයක (රු. 1,00,000) මුදලක් මත වසරකට සියයට විසිඅට (28%) සහ (25%) බැගින් පොළියක්, 2007.12.28 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ඉහල කොට්ටාරමුල්ල, පාලුවෙල්ගල, "සාරාංගා" හි පදිංචි වෙද මුහම්දිරම්ලාගේ ලයනල් ගුණසිරි මහතා සහ මහානාමනාම් ගීගන ගමගේ විමලාවතී මහත්මිය යන අයගෙන් එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. එකී අංක 5182 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ඉහත "1" හි සඳහන් මුදල සමග විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කුලියාපිටිය, පන්නල පාර, අංක 56හි පදිංචි වෙන්දේසිකාර ජේ. ඇල්පියස් පෙරේරා මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ දකුණු පිටිගල් කෝරළයේ, මැද පළාතේ, පාලුවෙල්ගල හි පිහිටි ඇහැලගහඕවිට නමැති ඉඩමේ ලොට් ඒ නමැති බෙදන ලද්දා වූ නිශ්චිත ඉඩම බලයලත් මිනින්දෝරු ඊ. සී. පීරිස් විසින් සාදන ලද 1946 අගෝස්තු මස 13 දිනැති අංක 1905 දරන පිඹුර අනුව උතුරට : කේ. ඩබ්. සිංඤෝ අප්පුහාමිගේ ඉඩම ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් බී ද. දකුණට : ලොට් ඊ (පාර) ද, බස්නාහිරට : ආර්. එච්. පුංචිඅප්පුහාමිගේ උරුමක්කරුවන්ගේ ඉඩම සහ රජයේ මිශ්‍ර පාසලට අයිති ඉඩම ද, මායිම්ව රූඩ් එකයි පර්චස් හයයි තුන්සිය විස්සෙන් විසිදෙකක (අ. 0, රූ. 1, පර්. 06 22/320) ප්‍රමාණයෙන් යුක්ත වේ. එකී ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. එම්. ජී. ඩයස් විසින් සාදන ලද 1987 මැයි 04 දිනැති අංක 958/87 දරන පිඹුරේ දැන් විස්තර කර ඇති අතර උතුරට : ඒ. ආර්. ජෝසප්ගේ ඉඩම ද, නැගෙනහිරට : ඒ. ආර්. පීටර්ගේ ඉඩම ද, දකුණට : පාර ද, බස්නාහිරට පාලුවෙල්ගල පාසලට අයිති ඉඩම ද, මායිම්ව රූඩ් එකයි පර්චස් හයක (අ. 0. රූ. 1, පර්. 6) බිම් ප්‍රමාණය සමඟ එහි සියලු දේ සමග එකී අංක 1905 දරන පිඹුරේ ලොට් ඊ හි පාරේ අයිතියද වේ. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ 87/91හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. පී. දයාරත්න,
කළමනාකරු.

ලංකා බැංකුව,
නාත්තන්ඩිය.

07-94

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතුයි.
5. සියලුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.
7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැගෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි.

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණන ගැසට් පිටුවකටම | 1,008 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ)

11. සෑම සිකුරාදා දියකටම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි
13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව * :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට රු. ශ. | පිටරට රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II, III ජේද තුනම ඇතුළත්) | 1,612 0 | 2,098 0 |
| II වැනි කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 0 | 745 0 |
| I වැනි ඡේදය | 520 0 | 1,007 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 0 | 1,009 9 |
| III වැනි ඡේදය | 468 0 | 907 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 0 | 4,422 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

* තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ ගාස්තුව රු. ශ. | තැපැල් (මෙරටඃ රු. ශ. |
|---|---|---|
| (අ) I වැනි කොටස | 31 0 | 5 0 |
| II වැනි කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 0 | 5 0 |
| (ආ) I වැනි ඡේදය | 10 0 | 5 0 |
| II වැනි ඡේදය | 12 0 | 5 0 |
| III වැනි ඡේදය | 9 0 | 5 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් අංක 132, මායා මාවත, කිරුළපන, කොළඹ 05 පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.

සැළකිය යුතුයි. - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2008** | | | |
| ජූලි | 2008.07.04 | සිකුරාදා | 2008.06.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.07.11 | සිකුරාදා | 2008.06.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.07.18 | සිකුරාදා | 2008.07.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.07.25 | සිකුරාදා | 2008.07.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2008.08.01 | සිකුරාදා | 2008.07.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.08.08 | සිකුරාදා | 2008.07.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.08.15 | සිකුරාදා | 2008.08.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.08.22 | සිකුරාදා | 2008.08.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.08.29 | සිකුරාදා | 2008.08.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2008.09.05 | සිකුරාදා | 2008.08.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.09.12 | සිකුරාදා | 2008.08.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.09.19 | සිකුරාදා | 2008.09.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.09.26 | සිකුරාදා | 2008.09.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන"**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.